සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2023 (2024)

# 62 - පුරවැසි අධ්‍යාපනය

## ලකුණු දීමේ පටිපාටිය




මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 62 - පුරවැසි අධ්‍යාපනය 1, 11

## අවසාන ලකුණු ගණනය කිරීම

### 1 පත්‍රය

ප්‍රශ්න අංක 01 - 40 (01 x 40) ලකුණු 40

### II පත්‍රය

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.

| | | |
|---|---|---|
| 1. ප්‍රශ්නය | ලකුණු 20 | |
| 2. ප්‍රශ්නය | ලකුණු 10 | ප්‍රශ්න 04 කට ලකුණු 10 x 4 = 40 |
| 3. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 4. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 5. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 6. ප්‍රශ්නය | ලකුණු 10 | |
| 7. ප්‍රශ්නය | ලකුණු 10 | |

| | | |
|---|---|---|
| I පත්‍රය | | ලකුණු 40 |
| II පත්‍රය | 20 + 40= | ලකුණු 60 |
| | අවසාන | ලකුණු100 |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **62**

විෂයය / பாடம்: පුරවැසි අධ්‍යාපනය

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 02 | 11. | 03 | 21. | 03 | 31. | 04 |
| 02. | 02 | 12. | 04 | 22. | 01 | 32. | 01 |
| 03. | 04 | 13. | 02 | 23. | 02 | 33. | 02 |
| 04. | 03 | 14. | 01 | 24. | 01 | 34. | 01 |
| 05. | 01 | 15. | 04 | 25. | 03 | 35. | 04 |
| 06. | 03 | 16. | 03 | 26. | 04 | 36. | 01 |
| 07. | 02 | 17. | 04 | 27. | 01 | 37. | 03 |
| 08. | 01 | 18. | 02 | 28. | 03 | 38. | 02 |
| 09. | 02 | 19. | 03 | 29. | 01 | 39. | 04 |
| 10. | 04 | 20. | 04 | 30. | 02 | 40. | 03 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: $\frac{25}{40}$

# 62 - පුරවැසි අධ්‍යාපනය II

※ **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

※ **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

1. (i) රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව පාලනය කිරීමෙන් අත්වන ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

(ii) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව බලතල බෙදා දක්වා ඇති ලැයිස්තුවලින් **දෙකක්** සඳහන් කරන්න.

(iii) බහු සංස්කෘතික සමාජයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iv) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීමේදී මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න **දෙකක්** ලියන්න.

(v) ගැටුම් ඇතිවීම කෙරෙහි බලපාන ප්‍රධාන මූල **දෙකක්** සඳහන් කරන්න.

(vi) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න.

(vii) පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන්ට අදාළ ප්‍රධාන තේමා **දෙකක්** ලියන්න.

(viii) අයිතිවාසිකම් දිනාගැනීම සඳහා ඇති වූ වැදගත් ඓතිහාසික අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.

(ix) පරිසර පද්ධතියේ සංරචක අතුරෙන් සමාජ පරිසරයට අයත් අංග **දෙකක්** ලියන්න.

(x) ජාත්‍යන්තර සබඳතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප **දෙක** නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**01 වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල**

- රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාලනය කිරීමේ වැදගත්කම විස්තර කරයි.
- ශ්‍රී ලංකාවේ පළාත් සභා අතර බලතල බෙදාහැර ඇති ලැයිස්තු නම් කරයි.
- ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ සාධක විස්තර කරයි.
- සමාජයක පවතින මූලික ආර්ථික ප්‍රශ්න පැහැදිලි කරයි.
- ගැටුම් ඇතිවීමට බලපාන සාධක විස්තර අර්ථ දක්වයි.
- අධිකරණයක ස්වාධීනත්වය ඇති කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරයි.
- පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් විමර්ශනය කරයි
- අයිතිවාසිකම් දිනාගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග විග්‍රහ කරයි.
- පරිසර පද්ධතියේ සංරචක පිළිබඳව විශ්ලේෂණය කරයි.
- ජාත්‍යන්තර සබඳතා පැවැත්විය හැකි ආකාරය පැහැදිලි කරයි.

(1)

- මූලික අයිතිවාසිකම් සුරක්ෂිතවීම
- නීතියේ රැකවරණය සැමට සමානව ලැබීම
- ආණ්ඩුක්‍රමයට සම්බන්ධ ආයතනවලින් රටවැසියන්ට සිය අවශ්‍යතා, සිතුම් පැතුම් ඉටු කරගත හැකිවීම
- අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂාවීම
- පාලකයන් අත්තෝමතික ලෙස ක්‍රියා කළහොත් එය වළක්වාලිය හැකි වීම
- පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලක පාලිත දෙපක්ෂයම දැනුවත් වීම
- පාලනයේ ක්‍රමවත්බව හා ස්ථාවරබව ආරක්ෂාවීම

**(ඉහත සඳහන් කර ඇති ඕනෑම දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න. මෙම අදහස්වලට සමාන අදහස ලැබෙන ආකාරයේ පිළිතුරු ලියා ඇත්නම් ඒවාද සැලකිල්ලට ගන්න)**

(ලකුණු 02)

(ii)

- පළාත් සභා ලැයිස්තුව (1 වන ලැයිස්තුව)
- සංචෘත ලැයිස්තුව (11 වන ලැයිස්තුව)
- සමගාමී ලැයිස්තුව (111 වන ලැයිස්තුව)

**මෙම ලැයිස්තුවලින් දෙකක් ලියා තිබිය යුතුය. නම් වශයෙන් හෝ අංක වශයෙන් ලියා ඇත්නම් එක් ලැයිස්තුවකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**

(ලකුණු 02)

(iii)

- විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරණ විවිධ භාෂා කතා කරන පුද්ගලයන් එකට ජීවත්වීම
- ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත් ආචාරධර්ම හා ඇගයීම් පද්ධතියක් තිබීම
- එක් ජන කොටසක වුවද ප්‍රාදේශීයව විවිධත්වයක් දැකිය හැකි වීම
- ලෝකයේ රටවල් ජාතීන් වශයෙන් තම දේශ සීමාවලින් ඔබ්බට ගොස් ජාතීන් සමග සම්මිශ්‍රණය වීම
- එකම විශ්ව ගම්මානයක් බවට පත්වීම
- සංස්කෘතික සම්මිශ්‍රණයක් සිදුවීම

**මෙම උත්තර වෙන් වෙන් වශයෙන් සඳහන් කර තිබුණද ලකුණු ලබා දීම කරන්න. ඉහත සඳහන් කර ඇති කරුණුවලින් දෙකක් ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න.**

(ලකුණු 02)

(iv)

- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේද?
- කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද?

**ඉහත සඳහන් මූලික ආර්ථික ප්‍රශ්න ලියා ඇත්නම් එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න. කුමක් කොපමණ යන්න ප්‍රශ්න දෙකක් ලෙස ලියා තිබුණත් නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න. එසේම කුමක් කොපමණ කෙසේ කවුරුන් සඳහා යනුවෙන් ලියා තිබුණත් ලකුණු දෙන්න.**

(ලකුණු 02)

(v)

- වාර්ගිකත්වය
- දේශපාලනය
- සමාජ ආර්ථික තත්ත්වය
- ආගමික මතවාද

**මෙම ගැටුම් හටගන්නා මූල දෙකක් ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න. සමාජ ආර්ථික තත්ත්වය යන්න කරුණු දෙකක් ලෙස ලියා තිබුණත් නිවැරදි පිළිතුරක් ලෙස සලකන්න.**

(ලකුණු 02)

(vi)

- විනිශ්චයකාරවරුන් ජනාධිපති විසින් පත් කිරීම
- විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ඒකාබද්ධ අරමුදලින් ගෙවීම
- විනිශ්චයකාරවරුන් ඉවත් කිරීමට විශේෂ ක්‍රියාවලියක් තිබීම
- වෙනත් තනතුරු පිළිගැනීම නොකළ යුතුවීම
- අනවශ්‍ය මැදිහත්වීම් පාලනය කිරීම් සීමා කිරීම
- අධිකරණ සේවා කොමිසමක් පිහිටුවා තිබීම

**ඉහත කරුණුවලින් ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කර තිබිය යුතුය. විස්තර නොමැතිව පෙළපොතේ සඳහන් කර ඇති ආකාරයට ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න.**

(ලකුණු 02)

(vii)

- පොදු මංමාවත්
- මහජන සෞඛ්‍යය
- පොදු උපයෝගීතා සේවා

**මෙම කරුණුවලින් දෙකක් ලියා තිබීම අවශ්‍යය.**

(ලකුණු 02)

(viii)

- ක්‍රි.ව. 1215 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම
- ක්‍රි.ව. 1689 - බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
- ක්‍රි.ව. 1776 - ඇමරිකානු නිදහස ප්‍රකාශනය
- ක්‍රි.ව. 1789 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය
- ක්‍රි.ව. 1917 - රුසියානු විප්ලවය

**මෙම පිළිතුරු අතරින් ඕනෑම දෙකක් ලියා ඇත්නම් නිවැරදි පිළිතුරු ලෙස සලකා ලකුණු දෙන්න. වර්ෂ ලියා තිබීම අනිවාර්ය නොවේ.**

(ලකුණු 02)

(ix)

- බහුවාර්ගික තත්ත්වය
- ආගම්
- කුල
- උරුම
- සිරිත් විරිත්
- යුතුකම් හා අයිතිවාසිකම්
- වගකීම් හා වගවීම්
- නෛතික සම්ප්‍රදායන්
- පවුල

**ඉහත දක්වා ඇති කරුණුවලින් දෙකක් ලියා තිබීම අවශ්‍යයි. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලබා දෙන්න. යුතුකම්, අයිතිවාසිකම්, වගකීම් හා වගවීම් වෙන වෙනම ලියා තිබුණත් නිවැරදි පිළිතුරු ලෙස සලකන්න.**

(ලකුණු 02)

(x)

- රාජ්‍ය උපාය සම්බන්ධතා/ සාමකාමී සම්බන්ධතා
- යුධ උපාය සම්බන්ධතා

**මෙම කරුණු දෙක ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් දෙන්න.**

(ලකුණු 02)

( 1 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 20)

**2.** රටක නීතිය ක්‍රියාත්මක කිරීම යුක්ති සහගතව හා සාධාරණව සිදු වන්නේ නම් සමාජය ද නීතිගරුක වීම නිතැතින්ම සිදු වේ.

(i) නීතිය ආරම්භ වීමට බලපෑ නීතියේ මූලාශ්‍ර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) අග්‍ර විනිශ්චයකාරතුමා විසින් රීති සම්පාදනය කරන ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත සඳහන් කරන ලද එක් ලක්ෂණයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

*2 වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *නීතිය ආරම්භ වීමට බලපාන මූලාශ්‍ර විස්තර කරයි.*
- *අග්‍රවිනිශ්චයකාරතුමාගේ කාර්යයන් හා බලතල පැහැදිලි කරයි.*
- *නීතියේ ආධිපත්‍යයේ දක්නට ඇති ලක්ෂණ විස්තර කරයි.*
- *නීතියේ ආධිපත්‍යයේ ක්‍රියාකාරීත්වය විග්‍රහ කරයි.*

(i)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- විවිධ අණපනත්
- අධිකරණ තීන්දු
- නීති විශාරදයන්ගේ මත
- විද්‍යාත්මක සිද්ධාන්ත
- සිරිත් විරිත්
- ආගම

**මෙම කරුණුවලින් ඕනෑම කරුණු දෙකක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි කරුණක් සඳහා එක ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**

(ලකුණු 02)

(ii)

- අභියාචනා භාර ගැනීම
- අභියාචනා විභාග කිරීම
- අභියාචනා නිෂ්ප්‍රභා කිරීම
- ඇප දීම
- නඩු කටයුතු නැවැත්වීම
- නීතිඥ වෘත්තිය සම්බන්ධ කටයුතු
- ජූරි සභා සම්බන්ධ කටයුතු
- පිස්කල් නිළධාරීන් සම්බන්ධ කටයුතු
- අධිකරණ සම්බන්ධ රීති සංශෝධනය, වෙනස් කිරීම
- අධිකරණ සම්බන්ධ නව රීති පැනවීම

**අග්‍රවිනිශ්චයකාරතුමා රීති පැනවිය හැකි ක්ෂේත්‍ර ඉහත දක්වා ඇත. ඒ අතුරින් ඕනෑම තුනක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි කරුණකට එක් ලකුණක් බැගින් ලකුණු තුනක් ලබා දෙන්න.**

(ලකුණු 03)

(iii)
(a)

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම
- නීතිය පිළිබඳව සෑම පුද්ගලයකුටම අවබෝධයක් තිබීම
- සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීම
- නීතිය ඉදිරියේ සෑම අයෙකුම සමාන පුද්ගලයන් සේ සැලකීම
- විනිශ්චයකරුවන්ට තීරණ ගැනීමේදී බලපෑම් සිදු නොවීම

**නීතියේ ආධිපත්‍ය තහවුරු වීමට මෙම කරුණු හේතුවේ. ඒ අතුරින් දෙකක් නිවැරදිව ලියා ඇත්නම් එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න. මෙවැනි අදහසක් මතුවන ආකාරයට ලියා ඇති පිළිතුරුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න.**

**උදා : ඉතා ඉක්මනින් සාධාරණව නඩු විසඳීම**

(ලකුණු 02)

(b)

**ඉහතින් සඳහන් කරන ලද කරුණුවලින් එක් කරුණක් තෝරා ගෙන එය ශ්‍රී ලංකාව තුළ දක්නට තිබේදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කළ යුතුය. සුදුසු නිදසුන් සැලකිල්ලට ගෙන විස්තර කිරීම සඳහා ලකුණු 03 ක් ලබා දෙන්න.**

(ලකුණු 03)
( 2 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

**3.** සෘජුව හෝ වක්‍රව පාලන කටයුතු සඳහා මහජනතාවට සහභාගිවීමට අවස්ථාව ලබාදෙන පාලන ක්‍රමයක් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලෙස හැඳින්වේ.

(i) ආණ්ඩුවක දක්නට ලැබෙන ප්‍රධාන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) වර්තමානයේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අපහසු වීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එක්** හේතුවක් අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

*3 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *ආණ්ඩුවක දක්නට ලැබෙන ප්‍රධාන ආයතන පැහැදිලි කරයි.*
- *ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ විශ්ලේෂණය කරයි.*
- *සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට දුෂ්කර වන සාධක ඇගයීමට ලක් කරයි.*
- *සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විග්‍රහ කරයි.*

(i)

- විධායකය
- ව්‍යවස්ථාදායකය
- අධිකරණය

**මෙම ආයතන අතුරින් දෙකක් නම් කර තිබීම අවශ්‍යය. අනුපිළිවෙළින් ලියා තිබීම අවශ්‍ය නොවේ. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**

(ලකුණු 02)

(ii)

- සර්වජන ඡන්දබලය පදනම් කරගෙන ආණ්ඩු සහ පාලකයන් තෝරා ගැනීම
- තරගකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම
- ඡන්ද කොට්ඨාස ක්‍රමයක් ක්‍රියාත්මක වීම
- නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
- ආණ්ඩු පක්ෂයක් හා විපක්ෂයක් පැවතීම
- නිදහස සමානාත්මතාව හා අයිතිවාසිකම් ආරක්ෂා වීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම
- මාධ්‍ය නිදහස හා තොරතුරු ලබා ගැනීමේ අයිතියක් තිබීම
- අධිකරණයේ ස්වාධීනත්වයක් තිබීම
- නීතියේ ආධිපත්‍ය හා නීතිය ඉදිරියේ සමානාත්මතාව

**ඉහත සඳහන් කරුණුවලින් ඕනෑම කරුණු තුනක් ලියා තිබිය යුතුය. මීට සමාන අදහස් ලියා ඇත්නම් ඒවාද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු 03 ක් ලබා දෙන්න.** (ලකුණු 03)

(iii)
(a)

- රාජ්‍යයට අයත් භූමි ප්‍රමාණය විශාලවීම
- අධික ජනගහනයකින් යුක්ත වීම
- සියලුම පුරවැසියන්ට එකතුවීමට අපහසුවීම
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම
- විවිධ දේශපාලන මතවාද පැවතීම

**මෙවැනි හේතු දෙකක් සඳහන් කර තිබීම අවශ්‍යයි. මෙයට සමාන වෙනත් අදහස් ලියා ඇත්නම් ඒවාද සැලකිල්ලට ගන්න.**

**උදා:- විවිධ ජාතීන් ජීවත් වීම වැනි එක් නිවැරදි පිළිතුරකට ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**

(ලකුණු 02)

(b)

**මෙහිදී වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම අනුගමනය කළ හැකිය.**

**කුඩා ප්‍රදේශ ලෙස බෙදා පාලනය කිරීම, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන, පළාත් සභා වැනි, ඇමරිකාවේ අනුගමනය කරන ඡන්ද ක්‍රමය ආදිය උදාහරණ ලෙස ගත හැකිය.**

**පිළිතුරෙහි නිවැරදිභාවය අනුව ලකුණු පැවරීම කරන්න. එක් ක්‍රමයක් විස්තර කර තිබීම ප්‍රමාණවත්ය.**

(ලකුණු 03)
( 3 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

**4.** විවිධ භාෂා කතා කරන, විවිධ ආගම් අදහන හා විවිධ සිරිත් විරිත් අනුගමනය කරන ජන කණ්ඩායම් එක්ව වාසය කිරීම බහු සංස්කෘතියක් ලෙස හැඳින්විය හැකි ය.

(i) ශ්‍රී ලංකාව තුළ බහු සංස්කෘතික සමාජයක් ඇති වීමට බලපෑ සාධකයක් වන සංක්‍රමණ සඳහා උදාහරණ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ශිෂ්‍යයකු ලෙස ඔබ දෙවන භාෂාවක් ඉගෙන ගැනීමෙන් ලැබෙන වාසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක කිරීමෙන් ජනතාව අත්පත් කරගන්නා වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එකක්** සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

*4 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල*

- *බහුසංස්කෘතික සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ විග්‍රහ කරයි.*
- *ශ්‍රී ලංකාව බහුසංස්කෘතික සමාජයක් ලෙස සැලකීමට හේතු විස්තර කරයි.*
- *යහපාලනයක් ක්‍රියාත්මක කිරීමෙන් ජනතාවට ලැබිය හැකි වාසි විමර්ශනය කරයි.*
- *බහුසංස්කෘතික සමාජයක ඇති විය හැකි වාසි යහපැවැත්මට හේතුවන ආකාරය සාකච්ඡා කරයි.*

(i)

- විජය ඇතුළු පිරිස පැමිණීම
- විජයගේ අභිෂේකය සඳහා ගෙන්වූ කුමරිය ඇතුළු පිරිස පැමිණීම
- පඬුවස්දෙව් ඇතුළු පිරිස පැමිණීම
- භද්දකච්චානා ඇතුළු පිරිස පැමිණීම
- මිහිඳු මහ රහතන්වහන්සේ ඇතුළු පිරිස පැමිණීම
- සංඝමිත්තා තෙරණිය ඇතුළු පිරිස පැමිණීම
- සංචාරක කටයුතු, රැකියා, අධ්‍යාපනය වැනි විවිධ හේතු මත වර්තමානයේදී රටකින් රටකට සංක්‍රමණය වීම

**ඉහත සඳහන් කර ඇති කරුණුවලින් දෙකක් ලියා තිබිය යුතුය. එක් කරුණකට එක් ලකුණක් බැගින් නිවැරදි පිළිතුරු සඳහා ලකුණු දෙකක් දෙන්න.**

(ලකුණු 02)

(ii)

- ජාතීන් අතර සහයෝගීතාව වර්ධනය වීම
- ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොලට ඇතුළත් විය හැකිවීම
- වෙනත් ජාතීන්ගේ සංස්කෘතියට ගරු කළ හැකිවීම
- වෙනත් ජාතීන්ගේ සංස්කෘතීන් අවබෝධ කර ගැනීමට හැකිවීම
- ජාතීන් අතර විශ්වාසය ගොඩනැගීම
- නව මිතුරු සබඳතා ඇතිවීම
- ගෝලීය පුරවැසියකු ලෙස කටයුතු කිරීමේ හැකියාව වර්ධනය වීම
- විශ්වීය දැනුම පහසුවෙන් ළඟා කර ගත හැකිවීම
- දේශ සීමාවලින් ඔබ්බට සිතන්නකු බවට පත්වීම

**මෙවැනි කරුණු තුනක් ලියා තිබිය යුතුය. නිවැරදි පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු 03 ක් ලබා දෙන්න.**

(ලකුණු 03)

(iii)
(a)

- විවිධ ජනවර්ග හා විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වීම
- එකිනෙකා අතර අවබෝධය පුළුල් වීම
- පාලන කටයුතු සඳහා සියළු ජනකොටස්වල සහභාගිත්වය වර්ධනය වීම
- එකිනෙකාට ගරු කිරීමට යොමු වීම
- ආගමික හා සංස්කෘතික විවිධතා නොසලකා සහජීවනය වර්ධනය වීම
- නීතිගරුක පුරවැසියන් ලෙස ජීවත් වීමට පුරුදු වීම
- විනිවිදභාවයෙන් කටයුතු කිරීම

**මෙම පිළිතුරු හෝ මීට සමාන අදහස් ඇති කරුණු දෙකක් ලිවීම අවශ්‍යයි. නිවැරදි එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**

(ලකුණු 02)

(b)
**ඉහත දක්වා ඇති කරුණුවලින් එකක් සමාජයේ යහපැවැත්මට හේතුවන ආකාරය විස්තර කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු පැවරීම කරන්න.**

**උදා:- සමාජයේ සාමය, සමගිය වර්ධනය වෙමින් සෑම සාමාජිකයන්ටම සතුටෙන් ජීවත් විය හැකි බව. ශිෂ්‍යයන් මේ සම්බන්ධව නිර්මාණාත්මක ලෙස ලියා ඇති පිළිතුරු සඳහා ලකුණු තුනක් ලබා දෙන්න.**

(ලකුණු 03)

( 4 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

**5.** පුද්ගල මනස තුළ ඇතිවන ඉලක්ක, අභිලාෂයන් සහ අවශ්‍යතාවන්ගේ විවිධත්වය මත ගැටුම් නිර්මාණය විය හැකි ය.

(i) රාජ්‍යයක් හෝ රාජ්‍ය දෙකක් අතර ඇතිවිය හැකි ගැටුම්වලට උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 02 යි)

(ii) මැදිහත්කරුවකු තෝරාගැනීමේදී විශේෂ අවධානය යොමු විය යුතු කරුණු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ගැටුම් නිරාකරණය කරගැනීම සඳහා පුරවැසියකු සතු විය යුතු පුද්ගල ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉන් **එක්** ගුණාංගයක් මගින් ගැටුම් නිරාකරණය කරගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

***5 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල***

- *සමාජයක ඇතිවිය හැකි විවිධ වර්ගයේ ගැටුම් නම් කරයි.*
- *ගැටුම් විසඳා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විමසා බලයි.*
- *ගැටුම් නිරාකරණයේදී මැදිහත්කරුවකු තුළ තිබිය යුතු ගුණාංග විස්තර කරයි.*
- *ගැටුම් වළක්වා ගැනීම සඳහා පුරවැසියකු ලෙස පුහුණු කර ගත යුතු ගුණාංග පැහැදිලි කරයි.*

(i)

- දේශසීමා
- සම්පත් බෙදාගැනීම
- දේශපාලන හේතූන් මත ඇති වන මතවාද
  උදා රුසියන් යුක්රේන් යුද්ධය, ඊශ්‍රායෙල් පලස්තීන ගැටුම්, ලංකාවේ පැවති යුද්ධය ආදිය දැක්විය හැකිය.

**උදාහරණ සපයා තිබීම අවශ්‍යයි. උදාහරණ නොමැතිව ඉහත කරුණු පමණක් දක්වා ඇත් නම් එක ලකුණක් පමණක් දෙන්න. උදාහරණ සපයා ඇත්නම් එක් කරුණකට එක ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න. උදාහරණ ලෙස අතීත සිද්ධීන් වුවද ලියා තිබීම නිවැරදි ලෙස සලකන්න.**

(ලකුණු 02)

(ii)

- දෙපාර්ශ්වයටම පිළිගත හැකි අපක්ෂපාතී පුද්ගලයකුවීම
- ගැටුම් පිළිබඳ පූර්ණ අවබෝධයක් ඇති අයකුවීම
- තමාගේ විසඳුම් තීන්දු ඔවුන් මත පටවන්නකු නොවීම
- දෙපාර්ශ්වයටම බලපෑම් එල්ල නොකිරීම
- දෙපාර්ශ්වයේම එකඟතාව මත විසඳුම් කරා යොමු කරවීම
- සෘජුව මුණ ගැසීමට නොහැකි අවස්ථාවල වෙන වෙනම හමුවී අදහස් ලබා ගෙන දෙපාර්ශ්වයටම සන්නිවේදනය කිරීම
- නම්‍යශීලී විසඳුම් කරා යොමු කර ජය - ජය විසඳුම් ලබා දීම

**ඉහත සඳහන් ආකාරයේ මැදිහත්කරුවකු තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු ලියා තිබිය යුතුය. මෙම අදහස් වෙනත් ආකාරයකින් ලියා තිබුණද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. මැදිහත්කරුවකු සතු ගුණාංග ලිය තිබුණද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. එක් නිවැරදි පිළිතුරුකට එක් ලකුණ බැගින් ලකුණු තුනක් ලබාදිය හැකිය.**

**(ලකුණු 03)**

(iii)

(a)

- ආත්මාවබෝධය
- ඉවසීම
- කරුණාව
- මෛත්‍රිය
- නිර්මාණාත්මක චින්තනය
- ඵලදායී තීරණ ගැනීම
- මුදිතාව
- දරාගැනීමේ ශක්තිය
- ඵලදායී සන්නිවේදනය
- සංවේදීබව
- අවිහිංසාව

**ඉහත සඳහන් කර ඇති කරුණුවලින් ඕනෑම දෙකක් ලියා තිබිය යුතුය. එක් නිවැරදි පිළිතුරකටලකුණු දෙක බැගින් ලකුණු දෙකක් ලබා දිය හැකිය.**

**(ලකුණු 02)**

(b)

**ශිෂ්‍යයකු ලෙස තමන්ට මුහුණ දීමට සිදුවන ගැටුම් නිරාකරණය කර ගැනීමේදී ඔහු විසින් අනුගමනය කල ගුණාංගයක් සඳහන් කර තිබිය යුතුය. එම ගුණාංගය මගින් ගැටුම් විසඳා ගන්නා ආකාරය විස්තර කර තිබිය යුතුය. පිළිතුරෙහි නිවැරදි බව මෙන්ම නිර්මාණාත්මක හා ප්‍රායෝගික බවද සැලකිල්ලට ගන්න.**

**(ලකුණු 03)**
**( 5 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**

**6.** **මනුෂ්‍යයන් ලෙස ගරුත්වයෙන් හා සමානාත්මතාවෙන් යුතුව සමාජයේ ජීවත්වීම සඳහා මානව අයිතිවාසිකම් අපට ප්‍රයෝජනවත් වේ.**

**(i) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) මගින් සහතික කර ඇති අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)**

**(ii) කාන්තාවන්ට එරෙහිව සිදුවන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (CEDAW) අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් තුනක් දක්වන්න. (ලකුණු 03 යි)**

**(iii) (a) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)**

**(b) පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබෙන් ඉටු විය යුතු යුතුකම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)**

***6 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල***

- *මානව අයිතිවාසිකම් සම්බන්ධ කරුණු විමර්ශනය කරයි.*
- *සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව විග්‍රහ කරයි.*
- *කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ ඇගයීමක් කරයි.*
- *ළමා අයිතිවාසිකම් සම්බන්ධ කරුණු විස්තර කරයි.*
- *ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.*
- *පාසල් ශිෂ්‍යයන්ගේ යුතුකම් විමර්ශනය කරයි.*

(i)

- ජීවත් වීමට ඇති අයිතිය
- වද හිංසාවලින් මිදී සිටීමට ඇති අයිතිය
- අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- පුද්ගලයකු ලෙස නීතිය හමුවේ පෙනී සිටීමේ අයිතිය
- අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටීමට ඇති අයිතිය
- පෞද්ගලික නිදහසට හා ආරක්ෂාවට ඇති අයිතිය
- වහල්භාවයෙන් මිදී සිටීමට ඇති අයිතිය
- සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- ආගම් ඇදහීමේ නිදහස
- සාමකාමී ලෙස රැස්වීමේ අයිතිය
- මැතිවරණවලදී ඡන්දය භාවිත කිරීමට ඇති අයිතිය
- මහජන නියෝජිතයකු ලෙස තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය

**ඉහත සඳහන් කරුණුවලින් ඕනෑම කරුණු දෙකක් ලියා තිබීම අවශ්‍යයි. මෙම අදහස මතුවන ආකාරයට ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු දෙකට ලකුණු දෙකක් දෙන්න.**

(ලකුණු 02)

(ii)

- කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්
- පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්
- අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය
- ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය
- සෞඛ්‍ය ආරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය
- සමාජ වෙනස්කම්වලින් ආරක්ෂාවීමේ අයිතිය

**ඉහත සඳහන් කරුණුවලින් තුනක් ලියා තිබිය යුතුය. මෙම අදහස මතුවන ආකාරයට ශිෂ්‍යයන්ගේ වචනවලින් ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු තුනට ලකුණු තුනක් දෙන්න.**

(ලකුණු 03)

(iii)

(a)

- එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම
- ළමයින් සම්බන්ධ සෑම ක්‍රියාවලියකදීම ළමයාගේ උපරිම යහපත සැලසෙන පරිදි ක්‍රියා කිරීම
- නීති සම්පාදනයේදී ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව සිදු කිරීම
- ජාතික ළමා ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම
- ළමා පැමිණිලි විභාග කිරීමට වෙනම කාර්යාංශයක් පිහිටුවීම
- ළමා ආරක්ෂාව සම්බන්ධ සෘජු දුරකථන අංකයක් (1929) හඳුන්වා දීම
- උප්පැන්න නොමැතිව පාසලකට ඇතුළත් වීමේ හැකියාව ලබා දීම

**මෙම කරුණු අතරින් ඕනෑම කරුණු දෙකක් ලිවිය යුතුය. මෙම අදහස මතුවන ආකාරයට ලියා ඇති කරුණුද නිවැරදි පිළිතුරු ලෙස සලකන්න. නිවැරදි පිළිතුරකට ලකුණු එකක් බැගින් කරුණු දෙකට ලකුණු දෙකක් දෙන්න.**

(ලකුණු 02)

(b)

- අධ්‍යාපනය නිසි ලෙස ලබා ගැනීම
- දක්ෂතා හා හැකියා වර්ධනය කර ගැනීම
- යහපත් පුරවැසියකු ලෙස පුහුණු වීම
- ගුරුවරුන්ට කීකරු වීම
- විනයගරුකව කටයුතු කිරීම
- පාසලේ නීති රීති සම්ප්‍රදායන් ආරක්ෂා කිරීම
- පාසලේ සම්පත් ආරක්ෂා කර ගැනීම

**ඉහත සඳහන් කරන ලද කරුණුවලින් තුනක් තෝරා ගෙන එම යුතුකම් කෙටියෙන් විස්තර කර තිබීම අවශ්‍ය ය. නම් කර ඇත්නම් පමණක් ලකුණු එකක් දෙන්න. නම් කර විස්තර කර ඇත් නම් සම්පූර්ණ ලකුණු දෙන්න.**

(ලකුණු 03)

( 6 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

**7.** අප අවට ඇති ජීවී-අජීවී සියල්ල පරිසරයට අයත්වන බැවින් පරිසරය ආරක්ෂා කරගැනීම මානව වර්ගයාගේ පැවැත්මට හේතු වේ.

(i) ස්වභාවික සංසිද්ධීන් නිසා පරිසරයට සිදුවන හානි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) ජලය දූෂණය වීමට බලපාන හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) ජලය දූෂණය වීම වළක්වා ගැනීම සඳහා ඔබට ගතහැකි ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ජලය දූෂණය වීම නිසා ඇති විය හැකි ගැටලු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 03 යි)

**7 වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල**

- *ස්වභාවික සංසිද්ධීන් නිසා පරිසරයට සිදු වන හානි විස්තර කරයි.*
- *ජලය දූෂණය වන අවස්ථා පැහැදිලි කරයි.*
- *ජලය දූෂණය වළක්වා ගත හැකි ආකාරය විස්තර කරයි.*
- *ජලය දූෂණය වීම නිසා ඇතිවිය හැකි ගැටලු විමර්ශනය කරයි.*

(i)

- නායයෑම්
- භූමිකම්පා
- ගිනිකඳු පිපිරීම
- ලැව්ගිනි
- හිමකඳු කඩාවැටීම/දියවීම
- ජලගැලීම්
- සුළිකුණාටු
- සුනාමි

**මෙම සංසිද්ධීන් අතුරින් ඕනෑම දෙකක් ලියා ඇත්නම් එකකට එක ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(ලකුණු 02)**

(ii)

- කර්මාන්ත මගින්
- කෘෂිකාර්මික කටයුතු මගින්
- ස්වාභාවික හේතු මගින්
- කුණු කසල එකතුවීම
- වාහන සේදීම
- අම්ල වැසි
- මැණික් ගැරීම

**මෙවැනි ආකාරයේ පිළිතුරු ලබා දිය හැකිය. මෙවැනි සුදුසු පිළිතුරුද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙන්න. කරුණු තුනක් ලියා තිබීම, අවශ්‍යය.**

**(ලකුණු 03)**

(iii)

(a)

- ජනතාව දැනුවත් කිරීම
- ජලමූලාශ්‍ර අපවිත්‍ර කරන පුද්ගලයන්ට විරුද්ධව අදාළ බලධාරීන්ට දැනුවත් කිරීම
- කාර්මික අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කරන ලෙස දැනුවත් කිරීම
- වාහන සෝදන ජලය ජල මූලාශ්‍රවලට මුදා නොහැරීම
- අපවිත්‍ර ජලය ජල මූලාශ්‍රවලට මුදා නොහැරීම
- කුණු හා අපද්‍රව්‍ය ජලයට මුදා නොහැරීම
- භාවිත කළ ජලය නැවත පිරිසිදු කර පරිසරයට මුදා හැරීම

**මෙවැනි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කළ හැකිය. එක් ක්‍රියාමාර්ගයකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න. කරන ලද යෝජනාවල ප්‍රායෝගිකබව හා නිර්මාණාත්මකබව කෙරෙහිද අවධානය යොමු කරන්න.**

**(ලකුණු 02)**

(b)

- ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණවීම
- දූෂිත ජලය මගින් ලෙඩරෝග ඇතිවීම
- ජලජ ජීවීන් මියයාම
- කෘෂිකාර්මික කටයුතු අඩාලවීම
- ජලජ ශාක ප්‍රජාව විනාශවීම
- ඇල්ගී සහ අහිතකර ජලජ ශාක පැතිරීම
- පාරිසරික සුන්දරත්වය විනාශවීම
- පිරිසිදු ජලය ලබා ගැනීමට පිරිවැයක් දැරීමට සිදුවීම

**මෙවැනි හේතු තුනක් නම් කර කෙටියෙන් විස්තර කර තිබිය යුතුය. නම් කර පමණක් ඇත්නම් එක් ලකුණක් පමණක් දෙන්න. විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.**

(ලකුණු 03)

( 7 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

(b)

- ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වයට බාධා පැමිණවීම
- දූෂිත ජලය මගින් ලෙඩරෝග ඇතිවීම
- ජලජ ජීවීන් මියයාම
- කෘෂිකාර්මික කටයුතු අඩාලවීම
- ජලජ ශාක ප්‍රජාව විනාශවීම
- ඇල්ගී සහ අහිතකර ජලජ ශාක පැතිරීම
- පාරිසරික සුන්දරත්වය විනාශවීම
- පිරිසිදු ජලය ලබා ගැනීමට පිරිවැයක් දැරීමට සිදුවීම

**මෙවැනි හේතු තුනක් නම් කර කෙටියෙන් විස්තර කර තිබිය යුතුය. නම් කර පමණක් ඇත්නම් එක් ලකුණක් පමණක් දෙන්න. විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.**

(ලකුණු 03)

( 7 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන්|පසුගිය ප්‍රශ්න පත්‍ර|වැඩ පොත් සඟරා|O/L ප්‍රශ්න පත්‍ර|
A/L ප්‍රශ්න පත්‍ර|අනුමාන ප්‍රශ්න පත්‍ර|අතිරේක කියවීම් පොත්|
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න